2024.09

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## පුරවැසි අධ්‍යාපනය

විභාග අංකය:

| 11 ශ්‍රේණිය | I | කාලය පැය 01 |
|---|---|---|

1 කොටස

සැලකිය යුතුයි:

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (I), (II), (III), (IV) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න

1. නීතියේ ආධිපත්‍යය පවතින බව විදහාපාන ලක්ෂණයක් නොවන්නේ,
   i. නීතිය ඉදිරියේ සමානාත්මතාව
   ii. පවත්නා නීතිය යටතේ වරදකරුවන්ට දඬුවම් පැමිණ වීම
   iii. නීතියේ රැකවරණය සියල්ලන්ට ම සර්ව සාධාරණ ව නොලැබීම
   iv. චෝදනා පත්‍රයකට අනුව පමණක් පුද්ගලයකු අත් අඩංගුවට ගැනීම
2. පළාත් සභාවක ප්‍රධාන ඇමති පත් කරනු ලබන්නේ,
   i.ජනාධිපතිවරයා විසිනි. ii. අගමැතිවරයා විසිනි.
   iii.ආණ්ඩුකාරවරයා විසිනි. iv. පළාත් පාලන ඇමතිවරයා විසිනි.
3. ඇමරිකා එක්සත් ජනපදයේ වර්තමාන ව්‍යවස්ථාව සම්පාදනය කළ වර්ෂය,
   i. 1948 ii. 1215.
   iii. 1787. iv. 1688.
4. වායු දූෂණය සිදු වන ස්වාභාවික ක්‍රමයක් වන්නේ,
   i.ගුවන් යානා භාවිතය. ii. දූවිලි කුණාටු.
   iii. කර්මාන්ත ශාලා. iv. ප්‍රවාහන කටයුතු.
5. ශ්‍රී ලංකාවට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් හඳුන්වාදුන් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,
   i. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය. ii. 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමය.
   iii. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය iv. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය.
6. ළමා අයිතිවාසිකම් උල්ලංඝණය වීම කෙරෙහි බලපාන හේතුවක් නොවන්නේ,
   i. අධ්‍යාපනයට ඇති අයිතිය අහිමි වීම
   ii. දෙමාපිය රැකවරණය හා ආදරය ලැබීම
   iii. සෞඛ්‍ය පහසුකම් අහිමි වීම
   iv. ළමයින් පැහැර ගෙන යාම
7. සංවර්ධිත රටවල් මුහුණපාන ගැටලුවක් වන්නේ
   i. බුද්ධිගලනය
   ii. අවාසිදායක වෙළෙඳ ශේෂය
   iii. ප්‍රාථමික භාණ්ඩවල මිල උච්චාවචයනය
   iv. බල ශක්ති අර්බුදය

8. ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීමේ බලය සහිත අධිකරණය වන්නේ,

i. ශ්‍රේෂ්ඨාධිකරණයයි.
ii. මහාධිකරණයයි.
iii.අභියාචනාධිකරණයයි.
iv.දිසා අධිකරණයයි.

9. පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ,

i.ජනාධිපතිවරයා ය.
ii. පළාත් ආණ්ඩුකාරවරයාය.
iii. අගමැතිවරයාය.
iv. අධිකරණ ඇමතිවරයාය.

10. ඇමරිකාවේ ව්‍යවස්ථාදායකය හඳුන්වන නම වනුයේ,

i.සන්ධීය මහා මණ්ඩලය.
ii. කොංග්‍රස් මණ්ඩලය.
iii.නියෝජිත මන්ත්‍රී මණ්ඩලය.
iv..පාර්ලිමේන්තුව.

11. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවන ලද වර්ෂය,

i. 1987.
ii. 1978.
iii. 1940.
iv. 1980.

12. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ගයකට උදාහරණයක් වන්නේ,

i.ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය.
ii. රෝම ලන්දේසි නීතිය.
iii.මුස්ලිම් නීතිය.
iv. අපරාධ නීතිය.

13. දිසා අධිකරණවලට විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලය පවතින්නේ,

i. අධිකරණ සේවා කොමිසමට ය.
ii. ජනාධිපතිවරයාට ය.
iii. අගවිනිසුරුතුමාට ය.
iv. නීතිපතිතුමාට ය.

14. ශ්‍රී ලංකාවට සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වන්නේ ,

i.1947 සෝල්බරි ව්‍යවස්ථාව.
ii. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව.
iii.ඩොනමෝර් ව්‍යවස්ථාව.
iv. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව.

15. නිෂ්පාදනය සඳහා මිනිසා විසින් යොදවනු ලබන විවිධ මෙවලම් හා උපකරණ හඳුන්වන්නේ,

i. කුලිය නමිනි.
ii. ප්‍රාග්ධනය නමිනි.
iii.ව්‍යවසායකත්වය නමිනි.
iv. ශ්‍රමය නමිනි.

16. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,

i.ආණ්ඩුකාරවරයායි.
ii. ජනාධිපතිවරයායි.
iii. අගමැති ප්‍රමුඛ අමාත්‍යමණ්ඩලයයි.
iv. රජු හෝ රැජිණයි.

17. ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්කයක් වනුයේ,

i.බදුල්ල .
ii. අනුරාධපුර.
iii.කෑගල්ල.
iv. මඩකලපුව.

18. දේශපාලනික හා සමාජ ආර්ථික වශයෙන් පවතින මතවාදී ස්වභාවයන් මුල් කර ගෙන ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,

i. යුධමය ගැටුම්
ii. අන්තර්ජාතික ගැටුම්
iii. අභ්‍යන්තර ගැටුම්
iv. මතවාදී ගැටුම්

19. ආණ්ඩුවට අයත් මූලික ලක්ෂණයක් වන්නේ,

i. අධිකරණය
ii. ජනගහනය
iii.භූමිය
iv. ස්වාධිපත්‍යය

20. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

i. පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම
ii. අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම
iii. මූලික අයිතිවාසිකම් සුරක්ෂිත නොවීම
iv. පාලකයන් අත්තනෝමතික ලෙස ක්‍රියා කළහොත් එය වළක්වා ගත හැකි වීම

21. පුද්ගල අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීම සඳහා යොදා ගන්නා භාණ්ඩ හා සේවා හඳුන්වන්නේ,

i. පාරිභෝගික භාණ්ඩ. ii. අන්තර් භාණ්ඩ.
iii. ප්‍රාග්ධන භාණ්ඩ. iv. ආයෝජන භාණ්ඩ.

22. සමාජවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන රටක් වන්නේ,
i.ඕස්ට්‍රේලියාව. ii. සිංගප්පූරුව.
iii.දකුණු කොරියාව. iv. කියුබාව.

23. ඩොමිනියන් තත්ත්වය අහෝසි කර ශ්‍රී ලංකාව ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම සිදු කරන ලද්දේ,
i.1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මගිනි ii. 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමය මගිනි.
iii. 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රමය මගිනි. iv. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය මගිනි.

24. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හඳුන්වන්නේ,
i. රාජ්‍ය මන්ත්‍රණ සභාව නමිනි. ii. පාර්ලිමේන්තුව නමිනි.
iii. සෙනෙට් සභාව නමිනි. iv. ජාතික රාජ්‍ය සභාව නමිනි.

25. අපරාධ නීතියට අනුව දඩුවම් ලැබිය හැකි බරපතල වැරදි වලට අයත් නොවන පිළිතුර,
i. මරණය සිදු කිරීම. ii. ස්ත්‍රී දූෂණය.
iii.ණය ගෙවීම පැහැර හැරීම. iv. කොල්ල කෑම.

26. ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන සාම්ප්‍රදායික ක්‍රමය ,
i.සාකච්ඡා කිරීමයි. ii. සමථකරණයයි.
iii.බේරුම්කරණයයි. iv. විනිසීමයි.

27. බේරුම්කරුවෙකු තුළ පැවතිය යුතු ගුණාංගයක් වන්නේ,
i.නිවැරදි තීරණ ගැනීම. ii. අවංක නොවීම.
iii. හොඳින් සවන් නොදීම. iv. පක්ෂපාතීත්වය.

28. නිෂ්පාදනයේ දී පිරිවැයක් දැරීමට සිදුවන සහ පරිහරණය සඳහා මිලක් ගෙවීමට සිදුවන භාණ්ඩ හඳුන්වන්නේ,
i.පාරිභෝගික භාන්ඩ නමිනි. ii. ආර්ථික භාණ්ඩ නමිනි .
iii.අන්තර් භාණ්ඩ නමිනි. iv. ආර්ථික නොවන භාණ්ඩ නමිනි.

29. 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පුරවැසි යුතුකම් ඇතුළත් කර ඇති වගන්තිය වන්නේ,
i. 2 වන වගන්තිය. ii. 3 වන වගන්තිය
iii.28 වන වගන්තිය. iv. 9 වන වගන්තිය

30. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පැහැදිලිව දක්නට ලැබෙන්නේ මින් කුමන ක්‍රියාවලිය තුළ ද?
i.මහ මැතිවරණය. ii. ජනමතවිචාරණය.
iii.පළාත් පාලන මැතිවරණය. iv. ජනාධිපතිවරණය.

31. බහු පක්ෂ ක්‍රමයක් යනු,

i. ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් ක්‍රියාත්මක වීමයි.

ii. රට තුළ නීත්‍යානුකූල ව එක් දේශපාලන පක්ෂයක් පමණක් පැවතීමයි.

iii.දේශපාලන පක්ෂ රාශියක් ක්‍රියාත්මක වීමයි.

iv. දේශපාලන පක්ෂ නොමැතිවීමයි.

32. දේපළ අයිතිය පෞද්ගලික අංශය සතු සහ ඒවා ලාභ අපේක්ෂාවෙන් ආර්ථික කටයුතුවල මෙහෙයවන ආර්ථික සංවිධානයක් හඳුන්වන්නේ,

i. ධනවාදී අර්ථ ක්‍රමයක් ලෙසය.

ii. සමාජවාදී අර්ථ ක්‍රමයක් ලෙසය.

iii.දෙමුහුන් අර්ථ ක්‍රමයක් ලෙසය.

iv. මිශ්‍ර අර්ථ ක්‍රමයක් ලෙසය.

33. ශ්‍රී ලංකාවට ප්‍රථම වරට පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දුන් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,

i. සෝල්බරි ආණ්ඩු ක්‍රමය.

ii. 1978 ආණ්ඩු ක්‍රමය.

iii. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය.

iv. 1972 ආණ්ඩු ක්‍රමය.

34. ස්විට්සර්ලන්තයේ සාමූහික විධායකය හඳුන් වන්නේ,

i. ජාතික සභාව නමිනි.

ii. සෙනෙට් සභාව නමිනි.

iii.රාජ්‍ය සභාව නමිනි.

iv. සන්ධීය සභාව නමිනි.

35. සිවිල් නීතියේ ශාඛාවක් වන්නේ,

i. ජාත්‍යන්තර නීතිය.

ii. අන්තර්ජාතික නීතිය.

iii.ගිවිසුම් නීතිය.

iv. අපරාධ නීතිය.

36. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මහ නගර සභා ගණන,

i.271.

ii. 9.

iii.23.

iv. 41.

37. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩිම ප්‍රමාණයක් අදහන ආගම වන්නේ,

i. කතෝලික

ii. ඉස්ලාම්

iii. හින්දු

iv. බෞද්ධ

38. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක අතුරින් පිහිටීමට අයත් වන සාධකය ,

i. පෙර අපර දෙදිග වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස පිහිටීම

ii. කාලිංග මාඝ ආක්‍රමණය

iii. පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම

iv. විජය ඇතුළු පිරිස පැමිණීම

39. ගැටුමක් හෝ මතභේදයක් විසඳීම සඳහා යොමු කරවන මැදිහත් වීම,

i. මැදිහත්කරණයයි.

ii. සහමන්ත්‍රණයයි.

iii. බේරුම්කරණයයි.

iv. සමථකරණයයි.

40. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවක මහ ඇමතිවරයා ද ඇතුළුව අමාත්‍ය මණ්ඩලය,

i. හත් දෙනෙකුගෙන් සමන්විත ය.

ii. හය දෙනෙකුගෙන් සමන්විත ය.

iii. පස් දෙනෙකුගෙන් සමන්විත ය.

iv. හතර දෙනෙකුගෙන් සමන්විතය.

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## පුරවැසි අධ්‍යාපනය

Learning Resource Center
De Mazenod College
Kandana

විභාග අංකය:

2024.09

| 11 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

**II කොටස**

*** පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
*** පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 I. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න.

II. අභ්‍යන්තර ගැටුම් වර්ග කරන ප්‍රධාන කොටස් දෙක ලියන්න.

III. සමාජවාදී අර්ථ ක්‍රම පවතින රටවල් දෙකක් ලියන්න.

IV. නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම ද ලියන්න.

V. පරිසර පද්ධතිය සකස් වී ඇති ප්‍රධාන සංරචක දෙක ලියන්න.

VI. රාජ්‍යයක් තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

VII. ස්විට්සර්ලන්තයේ ව්‍යවස්ථාදායකය සමන්විත වන ආයතන දෙක ලියන්න.

VIII. ආගම් පදනම් කරගෙන සකස් වී ඇති නීතිවලට උදාහරණ දෙකක් ලියන්න.

IX. මහ අධිකරණවලට විසඳිය හැකි නඩු වර්ග දෙකක් ලියන්න.

X. බහු සංස්කෘතික සමාජයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

02. දේශපාලන සංවිධානයක් ලෙස ජාතික රාජ්‍යය යුරෝපයේ ස්ථාපිත වන්නේ 15 වන සියවසෙන් පසුව ය.

I. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක නම් කරන්න. (ලකුණු 2)
II. ජාතික රාජ්‍ය පිළිබඳ සංකල්පය ශක්තිමත් තත්ත්වයකට ගෙන ඒමට දායකත්වය සැපයූ දේශපාලන චින්තකයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 3)
III. a. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)
b. ඉන් එක් ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 2)

03. මිනිසා ඇතුළු සියලු සත්වයින් ද ශාක ප්‍රජාව ද ඇතුළු සජීවී අජීවී සියල්ල ම පරිසරයට අයත් වේ.

I. ස්වාභාවික පරිසරයට අයත් ප්‍රපංච දෙකක් ලියන්න. (ලකුණු 2)
I. පරිසරයෙන් ලැබෙන සේවාවන් තුන ලියන්න. (ලකුණු 3)
II. a. මානව ක්‍රියාකාරකම් හේතුකොට ගෙන පැන නැගී ඇති පාරිසරික ගැටලු තුනක් ලියන්න. (ලකුණු 3)
b. ඉන් එක් ගැටලුවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

04.මනුෂ්‍යයන් ලෙස ගරුත්වයෙන් හා සමානාත්මතාවෙන් යුතුව සමාජයේ ජීවත් වීමට මානව අයිතිවාසිකම් ඉවහල් වේ.

I. මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 2)

II. මානව අයිතිවාසිකම් සුරකින ජන සමාජයක දැකිය හැකි සාධනීය ලක්ෂණ තුනක් ලියන්න..(ලකුණු 3)

III. a.මානව අයිතිවාසිකම් පනතට අදාළ ලේඛන තුනක් ලියන්න. (ලකුණු 3)

b.ඉන් එක් ලේඛනයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

05.ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිහිටුවා ඇත.

I.ශ්‍රී ලංකාවේ බලය බෙදීම පිළිබඳ ව අදහස ක්‍රියාවට නැංවීමට ගත් උත්සාහයන් දෙකක් ලියන්න. (ලකුණු 2)

II.බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු තුනක් ලියන්න. (ලකුණු 3)

III. a.වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග තුන ලියන්න.(ලකුණු 3)

b.ඉන් එක් ආයතනයක් ගැන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

06.නීතිය ක්‍රියාත්මක කිරීම යුක්ති සහගත ව හා සර්ව සාධාරණ ව සිදුවිය යුතු වේ.

I. අන්තර්ජාතික නීති බලාත්මක කිරීමේ වැදගත් කාර්යයක් ඉටු කරන ආයතන දෙකක් ලියන්න. (ලකුණු 2)

II. අන්තර්ජාතික නීතිය ඇසුරෙන් පැන නැගුණ නීතියේ ශාඛා තුනක් ලියන්න. (ලකුණු 3)

III. a.ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග තුනක් ලියන්න. ( ලකුණු 3)

b.ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

07.තාක්ෂණයත් සමග ලෝකය සමීප වීම ගෝලීයකරණය ලෙසින් ව්‍යවහාර කරනු ලැබේ.

I. ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2)

II. ගෝලීයකරණය තුළ ලොව ම තනි ආර්ථික ඒකකයක් බවට පත් කිරීමට සහාය වීම සඳහා පිහිටුවා ඇති ආයතන තුනක් ලියන්න. (ලකුණු 3)

III. a.ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇතිවී තිබෙන ඍණාත්මක බලපෑම් තුනක් ලියන්න. (ලකුණු 3)

b.ගෝලීයකරණයෙන් සිදුවන ඍණාත්මක බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාව අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)